ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය -2024/2025

**STP9812 - අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම**

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2026.01.25 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. (i.) සාරධර්ම අධ්‍යාපනය නිර්වචනය කර සාරධර්ම අධ්‍යාපනය පිළිබඳ සංකල්පය විස්තර කරන්න. (ලකුණු 05)

(ii.) සාරධර්ම අධ්‍යාපනය කෙරෙහි සමකාලීන මාධ්‍ය මගින් සිදුවන ධනාත්මක බලපෑම් හතරක් (04) නිදසුන් මගින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ සාරධර්ම සංවර්ධනය කිරීමෙහි දී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග හතරක් (04) කෙටියෙන් විස්තර කර, ඉන් එකක් සඳහා විසඳුමක් යෝජනා කරන්න. (ලකුණු 10)

02. (i.) අධ්‍යාපනය හා මානව සංවර්ධනය අතර සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) මානව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනය තුළ 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ලබාදුන් දායකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10)

(iii.) තාක්ෂණය මගින් ඇතිකරන ලද වැඩලෝකයේ අනාගත වෙනස්කම්වලට මුහුණ දීම සඳහා ශ්‍රී ලාංකික සිසුන් තුළ වර්ධනය කළ යුතු නිපුණතා පහක් (05) උදාහරණ සමගින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

03. (i.) අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ප්‍රාථමික සමාජානුයෝජන කාරකයක් ලෙස න්‍යෂ්ටික පවුල සපයන ධනාත්මක සාධක කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 05)

(ii.) පහළ සමාජ පන්තිය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කර, ශ්‍රී ලාංකීය සංදර්භය තුළ පහළ සමාජ පාන්තික සිසුන් මුහුණ දෙන අධ්‍යාපනික ගැටලු පහක් (05) උදාහරණ සහිතව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පරම්පරා අතර සචලතාවට උපකාර වේ. මෙම ප්‍රකාශයට පක්ෂව හේතු දක්වන්න. (ලකුණු 10)

04. (i.) අධ්‍යාපනය මගින් ඉටු කිරීමට අපේක්ෂිත සමාජ අපේක්ෂණ **පහක් (05)** කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 05)

(ii.) අධ්‍යාපනය සම්බන්ධව කාර්යබද්ධවාදීන් ඉදිරිපත් කළ පර්යාවලෝකයන් විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(iii.) වර්තමාන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සැලකිය හැකිද? හේතු **පහක් (05)** ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. (i.) දේශපාලන සමාජානුයෝජනය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) සමාජයේ පුද්ගලයන්ට දේශපාලනයට මැදිහත්විය හැකි ආකාරයන් නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(iii.) පාසලේදී දේශපාලනය ඉගැන්වීම මගින් සිසුන් තුළ සංවර්ධනය කළ යුතු ප්‍රජාතන්ත්‍රවාදී අගයන් **පහක් (05)** හඳුනාගෙන, ගුරුවරයෙකු ලෙස මෙම අගයන් පෝෂණය කිරීම සඳහා ඔබට ගත හැකි පියවර පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. (i.) "අධ්‍යාපනය මගින් පූර්ණ පුද්ගලයෙකු සංවර්ධනය කළ යුතු බවට පෙරදිග දාර්ශනිකයන්ගේ මතය විය." දාර්ශනික මතවාද **දෙකක් (02)** ඇසුරින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(ii.) අධ්‍යාපනයේ අරමුණු සම්බන්ධව පෙරදිග හා අපරදිග දාර්ශනිකයන් ඉදිරිපත් කළ කරුණු සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(iii.) අධ්‍යාපනය සමාජ වෙනස්වීම් කාරකයක් ලෙස ක්‍රියා කිරීමේ දී ඇති විය හැකි අභියෝග **පහක් (05)** හඳුනාගෙන, ඒවා අවම කර ගැනීමට පාසලට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

\- හිමිකම් ඇවිරිණි. -